## ශීර්ෂය 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම (SA-21) අනුව අනෙකුත් මූලාශ්‍රවලින් ලැබුණු අග්‍රිම ප්‍රමාණය රුපියල් මිලියන 581.65 ක් වුවද, එය අග්‍රිම ගිණුම් ප්‍රකාශයේ (ACA3) රුපියල් මිලියන 632.26 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රුපියල් මිලියන 50.61 ක වෙනසක් පැවතුණි. | SA-70 පරිදි භාණ්ඩාගාර යෙන් ලද ප්‍රතිපාදන රුපියල් 632,264,288 ක් වන අතර එය 2021 අවසාන ගිණුමේ ACA3 යටතේ දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි ගිණුම් තොරතුරු සටහන් කල යුතුය. |

(ආ) පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිවිල් ආරක්ෂක සේවාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවන ලද රුපියල් මිලියන 4.95 ක් අනෙකුත් සේවා (ප්‍රාදේශීය) යටතේ ගිණුම්ගත නොකර අනෙකුත් සේවා (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනෙකුත් සේවා වියදම් එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. | අදාල වියදම් දැරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නොවූ නිසා ප්‍රතිපාදන මාරු කර ඇත. | වැය විෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම සිදු කල යුතුය. |

(ඇ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූලාා ප්‍රකාශන අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නොවන වාහනයකට අදාළ අළුත්වැඩියා කිරීමේ වියදම රුපියල් මිලියන 2.05 ක් වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාහන නඩත්තු වියදම්, එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි අළුත්වැඩියා වියදම් දරා ඇත. | වැය විෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම සිදු කල යුතුය. |

(ඈ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කඩිනමින් යොමු කිරීමට පියවර ගනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | --- | -<br>රු.මිලියන | | -- | -<br>- |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 208 (2) (අ) වගන්තිය | 12.50 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව, ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කල නිවාස ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 587.01 ක් ලබා දී තිබුණි. ඉන් රුපියල් මිලියන 574 ක් 2019 හා 2020 වර්ෂ වල ක්‍රියාත්මක කළ ඉහත වැඩසටහනට අදාල වියදම් ලෙස අඩුකිරිම හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදන රු. මිලියන 574.51 ක් විය. එමෙන්ම මෙම වගන්තියට පටහැනිව නිදහස් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා කන්තලේ හා සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ නිවාස ඉදිකිරීම් වෙනුවෙන් රුපියල් මිලියන 12.49 ක ප්‍රතිපාදනද ලබා දී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හි 2 (iv) | නිවාඩු දින වැටුප් රුපියල් 627,775 ක් හා අතිකාල දීමනා රුපියල් 574,343 | කින්නියා හා තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් තහවුරු කර නොගෙන නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ගෙවා තිබුණි. | පැමිණීමේ / පිටවීමේ ලේඛනය මගින් තහවුරු කර ගෙන අදාල ගෙවීම් සිදු කර ඇත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iii) | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 6/2016 හි 8.3 ඡේදය | | තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගැබිණි මව්වරුන් සඳහා භාණ්ඩ මිලදී ගැනීමට ලියාපදිංචි වෙළඳ ආයතන පිළිබඳ පසු විපරම් කර වාර්තාවක් ලබා දිය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව නිරන්තර අධීක්ෂණය කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | -එම- |
| (iv) | සමාජ සේවා, සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අංක MSS/ADM/10/2/10 දරන චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදය | | තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි දීමනා ලාභීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ මියගිය පුද්ගලයින් 25 දෙනෙකුගේ සහතිකපත් අවලංගු කර, එම අවලංගු කරන සහතික පත් ප්‍රාදේශීය ලේකම් භාරයට ගෙන නොතිබුණි. | මේ පිළිබඳ ග්‍රාම නිලධාරී දැනුවත් කර ඇති බව අප වෙත දන්වා ඇත. | -එම- |
| (v) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 ජුලි 20 දිනැති අංක 01/2018 චක්‍රලේඛයේ 5 (iii) හා 6 (ආ) ඡේදය | මිලියන 1.14 රු. 112,850 | මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වසර දෙකකට වඩා වැඩි කාලයක් විදේශගත වූ පුද්ගලයකුට සහ විදේශගත වූ විශ්‍රාමිකයින් දෙදෙනෙකු සඳහා මාසිකව ජීවන වියදම් දීමනාව ලෙස රු.3,525 බැගින් මාස 74 ක් සඳහා චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. | විශ්‍රාම වැටුප් අංශයෙන් ලද උපදෙස් අනුව කටයුතු කර ඇත. වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත. | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (vi) | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 මැයි 17 දිනැති අංක SMRHC/RD/04/01 දරන චක්‍ර ලේඛයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක - 2021<br>-------------------------<br>ලකුණු ලබා දීමේ ක්‍රමයේ අංක 6 වගන්තිය | | නැවත පදිංචි කිරීමේ වැඩ සටහනේ නිවාසලාභීන් ලෙස ආබාධිත පුද්ගලයින් තෝරා ගැනීමේදී යුද්ධය හෝ ඒ ආශ්‍රිත හේතු නිසා ආබාධිත වූවන් තෝරාගත යුතු වුවත්, විවිධ ස්වභාවික හේතු, වෙනත් අනතුරු හා රෝග නිසා ආබාධිත වූවන් ද ප්‍රතිලාභී පවුල් ලෙස කින්නියා, කුච්චවේලි, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරාගෙන තිබුණි. ඒ අනුව රුපියල් 600,000 නිවාස වැඩසටහනේදී තෝරා ගෙන තිබූ ප්‍රතිලාභීන් 11 ක් සහ රුපියල් මිලියන 1 නිවාස වැඩසටහනේදී තෝරා ගෙන තිබූ ප්‍රතිලාභීන් 16 ක් සඳහා රුපියල් මිලියන 14.40 ක නිවාස ආධාර ලබා දීමට කටයුතු කර තිබුණි. | නැවත පදිංචි කිරීමේ වැඩ සටහනේ නිවාසලාභීන් ලෙස ආබාධිත පුද්ගලයින් තෝරා ගැනීම පිළිබඳව අමාත්‍යාංශ ලිපිය මගින් විශේෂ පෙන්වා දීමක් කර නොතිබූ අතර අදාල නිර්ණායක හා ග්‍රාමීය කමිටු නිර්දේශ මගින් සුදුසු ප්‍රතිලාභී පවුල් තෝරා ගැනීමට කටයුතු කර ඇත. | ලකුණු ලබා දීමේ ක්‍රමයේ අංක 6 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | මූලික සුදුසුකම් හී අංක 03 වගන්තිය | | ගැටළුකාරී කාලයේදී සම්පූර්ණයෙන් හානියට පත් නිවාස වල පදිංචි වී සිටි පවුල් සඳහා ස්ථිර නිවාස ලබා දිය යුතු වුවද ආරවුල් හේතුවෙන් නිවාස සම්පූර්ණයෙන්ම හානි වූ බවට හෝ යුද්ධ කාලයේදී ස්ථිර නිවාස තිබූ බවට හෝ සනාථ වන විධිමත් ලියවිලි කින්නියා, කුච්චවේලි, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ තෝරා ගෙන තිබූ | ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ අදාල මූලික නිර්ණායක මෙන්ම හා ග්‍රාමීය කමිටු නිර්දේශ මගින් සුදුසු ප්‍රතිලාභී පවුල් නම් කිරීමෙන් පසුව ප්‍රතිලාභීන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් කිරීමෙන් අනතුරුව | චක්‍රලේඛයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක - 2021 හි මූලික සුදුසුකම් හී අංක 03 අනුව කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | නිවාස ප්‍රතිලාභීන්ගේ ලිපි ගොනු අනුව හඳුනාගත නොහැකි විය. එමෙන්ම ඉහත දැක්වූ නිර්ණායකයට පටහැනිව රුපියල් මිලියන 1 ක නිවාස වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 162 දෙනෙකුට හා රුපියල් 600,000 ක නිවාස වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 151 දෙනෙකුට එකතුව නිවාස 313 ක් සඳහා රුපියල් මිලියන 252.6 ක් නිවාස ආධාර ලබාදීමට කටයුතු කර තිබුණි. | ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කර ඇත. | |
| (vii) | ආයතනයේ කළමනාකරණ හා අභ්‍යන්තර නියෝගවලට අනුකූල නොවීම<br>----------------------------<br>--නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාසලාභීන් ලෙස අනු පවුල් තෝරා ගැනීමේදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ 2016 සැප්තැම්බර් මස GAT/EST/RESET/HOU/VOLII/ 2016 දරන ලිපිය | මිලියන 56.40 ක් | නැවත පදිංචි වීමට පෙර විවාහ වී සිටින පවුල් පමණක් නැවත පදිංචි කිරීමේ වැඩසටහනට තෝරාගත යුතු වුවත්, නැවත පදිංචි වීමෙන් පසු වර්ෂවල විවාහ වූ පුද්ගලයින් ද ප්‍රතිලාභී පවුල් ලෙස සලකා කින්නියා, ගෝමරන්කඩවල, සේරුවිල, කන්තලේ සහ මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තෝරාගෙන තිබූ අතර රුපියල් මිලියන 1 ක නිවාස ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 42 ක් හා රුපියල් 600,000 ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 24 ක් ලෙස ප්‍රතිලාභීන් 66 දෙනෙකුට ගෙවීමට කටයුතු කර තිබුණි. | ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳ ප්‍රාදේශිය ලේකම්වරු සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති සාකච්ඡාවේදී ඉස්මතු වූ කරුණු ද පදනම් කරගෙන සුදුසුම අය වෙත ප්‍රතිලාභ දී ඇත. | දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය අනුව ක්‍රියා කල යුතුය. |

(ඊ) අවිධිමත් ගනුදෙනු

--------------------

අනුමත නොකළ ගනුදෙනු

---------------------------------

විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගනුදෙනු සිදු කර තිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සේරුවිල සහ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අඩු ආදායම්ලාභි ආබාධිත පුද්ගලයින් සඳහා රුපියල් 5000 දීමනාව ලබා දීමේදී අදාල ප්‍රතිලාභීන් තෝරා ගැනීම චක්‍රලේඛයේ විධි විධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී පුද්ගලයින් 178 ක් සඳහා අවස්ථා 2,124 කදී එකතුව රුපියල් මිලියන 10.62 ක දීමනාවක් ගෙවා තිබුණි. | ප්‍රතිලාභීන් තෝරා ගැනීම චක්‍රලේඛ විධිවිධාන, ග්‍රාමීය කමිටු හා ග්‍රාම නිලධාරීන්ගේ නිර්දේශ මත සිදු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ 2021 දෙසැම්බර් 30 දිනැති අංක GAT/EST/RESET/SMHC/HP/02/ 2021 දරන ලිපිය මඟින් කන්තලේ සහ සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රුපියල් 600,000 ක නිවාස වැඩසටහන යටතේ අතිරේක නිවාස 21 ක් ලබා දී තිබූ අතර අග්‍රිම ප්‍රතිපාදන නොතිබියදී එලෙස අතිරේක නිවාස 21 ක් සඳහා රුපියල් 150,000 බැගින් පළමුවන වාරිකය ලෙස රුපියල් මිලියන 3.15 ක් ගෙවා තිබුණි. | කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රුපියල් 600,000 යේ නිවාස වැඩසටහන යටතේ අතිරේක ප්‍රතිපාදන නිවාස 15 ක් ලබා දී තිබූ අතර එම නිවාස 15 වෙනුවෙන් පළමු වාරිකය ගෙවා ඇත. | අනුමත ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් වියදම් දැරීම සිදු කල යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 අග්‍රිම කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 3,959.84 ක අග්‍රිම ඉල්ලා තිබුණ ද රුපියල් මිලියන 3,171.64 ක අග්‍රිම පමණක් ලැබීම හේතුවෙන් ඉල්ලා ඇති අග්‍රිම හා ලැබුණු අග්‍රිම අතර වෙනස රුපියල් මිලියන 788.20 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 88.49 ක් ගෙවිය යුතු බිල්පත් ලෙස දක්වා තිබුණි. | ඉල්ලුම් කරන ලද අක්මුදල් නොලැබීම නිසා ගෙවිය යුතු බිල්පත් ලෙස ඇතුලත් කර ඇත. | මාසික වියදම් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන අග්‍රිම සැලසුම් කොට අග්‍රිම ඉල්ලුම් කිරීමට කටයුතු කල යුතුය. |

2.2 වියදම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වියදම් විෂයයන් 6ක් සහ ප්‍රාග්ධන වියදම් විෂයක් සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 41.72 ක් වූ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 14.29 ක් පමණක් වියදම් කර තිබූ අතර රුපියල් මිලියන 27.44 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉතුරුම් සියයට 10 සිට සියයට 100 දක්වා වූ අතර ඉතිරි වීමට හේතු හෙළිදරව් කර නොතිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 6 ක හා කාර්යය මණ්ඩල පුහුණු වැය විෂය යටතේ ඉටුකර ගැනීමට අපේක්ෂාකල අරමුණු ඉටු වී නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම වැඩ සටහන ක්‍රියාත්මක නොවූ නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන නිසි පරිදි සැළසුම් කළ යුතුය. |
| (ආ) | අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් වැය විෂයන් 14ක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රතිපාදන රුපියල් මිලියන 21.25 ක් ලබා දී තිබුණද රුපියල් මිලියන 23.05 ක් වැය කර තිබුණු බැවින් රුපියල් මිලියන 1.80 ක් අනුමත ප්‍රතිපාදනය ඉක්මවා තිබුණු අතර එය අධිකාරී බලය නොලත් ඉක්මවීමක් ලෙස අනාවරණය විය. | අලුතින් බඳවාගත් නිලධාරීන්ගේ වැටුප් හා දීමනා එකතු වීමෙන් සහ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඇතැම් වියදම් මෙහි අන්තර්ගතව ඇත. | අනුමත ප්‍රතිපාදනය නොඉක්මවන ලෙස වියදම් කලමණාකරණය කර ගත යුතුය. |
| (ඇ) | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කල නිවාස ව්‍යාපෘතිය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය වෙනුවෙන් නිදහස් කර තිබූ රුපියල් මිලියන 587.01 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දරන ලද ශුද්ධ වියදම රුපියල් මිලියන 495.22 ක් වීමෙන් රුපියල් මිලියන 91.79 ක් ඉතිරිව පැවතියදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් යටතේ ක්‍රියාත්මක කල නිවාස | අක්මුදල් නොලැබීමත් මිල විචලනයන් සිදුවීමත් නිසා සැළසුම් කළ පරිදි ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි විය. | රජයේ ප්‍රතිපාදන නිසි පරිදි කළමණාකරණය කළ යුතුය. |

වැඩසටහන් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට අවිච්ඡේද වැඩ වටිනාකම රුපියල් මිලියන 94.29 ක් වී තිබුණි. ඉතිරිව ඇති ප්‍රතිපාදනය, අවිච්ඡේද වටිනාකමට සමාන විය යුතු වුවත් ඉතිරිව ඇති ප්‍රතිපාදනයට වඩා , අවිච්ඡේද වටිනාකම රුපියල් මිලියන 2.5 ක් විය.

2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය
------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 15 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දුන් රුපියල් මිලියන 1,045.75 ක ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 615.42 ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් රුපියල් මිලියන 430.34 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ මෙම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කල ව්‍යාපෘති වලින් ඉටුකර ගැනීමට අපේක්ෂා කල අරමුණු ඉටු වී නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අත්හැර දැමීමට සිදු වූ ක්‍රියාකාරකම් හේතුවෙන් එම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | අනෙකුත් සැපයුම් වියදම් සඳහා ලබා දී තිබූ රුපියල් මිලියන 25 ක පරිපූරක ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. එම හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට අපේක්ෂා කල වී මිලදී ගැනීමේ කටයුතු ඉටුවී නොතිබුණි. | විවෘත වෙළඳපල වී මිල ඉහලින් තිබීමත්, ගොවීන්ට ගබඩා හා වියලීමේ පහසුකම් නොතිබීමත්, සුදුසු වී මෝල් හිමියන් පිරිසක් වැඩසටහනට එක් නොවීමත් නිසා එම ප්‍රතිපාදනය, වියදම් නොකර ඉතිරි වී ඇත. | ලැබෙන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි වන සේ කටයුතු සැළසුම් කල යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 සැලැසුම් කිරීම
-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන - 2021 යටතේ අංශ 14 ක් සඳහා රුපියල් මිලියන 41.53 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර එම ප්‍රතිපාදනය සියළු අංශ සඳහා ප්‍රමුඛතා පදනම | පාර්ලිමේන්තු මන්ත්‍රීන් විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා ශක්‍යතා අධ්‍යයනයෙන් | 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/ 2021 දරන ලිපියේ 2.4 ඡේදය |

| | | |
|---|---|---|
| මත වෙන් නොකර ලියාපදිංචි පෙරපාසල්, දහම්පාසල්, සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ ලබා දීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 240 ක් සඳහා රුපියල් මිලියන 13.07 ක් හා තරුණ හා කාන්තාවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා භාණ්ඩ ලබා දීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 103 ක් සඳහා රුපියල් මිලියන 15.32 ක් වශයෙන් එකතුව රුපියල් මිලියන 28.39 ක් ලබා දී තිබුණි. අනෙක් අංශ 12 වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 138 ක් සඳහා රුපියල් මිලියන 13.14 ක් පමණක් ලබා දී තිබුණි. නමුත් 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/2021 දරන ලිපියේ 2.4 ඡේදය අනුව විවිධාංගීකරණය වූ අයවැය අරමුදල් සැපයීම හා බෙදාහැරීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාව, දිළිඳුකම සහ භූමි ප්‍රමාණය මත පදනම්ව සාධාරණ ආකාරයකින් සිදු කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය එලෙස කටයුතු කර නොතිබුණි. | යුතුව අමාත්‍යාංශයේ අනුමැතිය හා ප්‍රතිපාදන ලද පසුව ක්‍රියාත්මක කර ඇත. | අනුව කටයුතු කළ යුතුය. |

3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම වෙනුවෙන් "ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය" යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ග්‍රාම ශක්ති ජනතා සමිති 33 ක් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 52.19 ක් ලබා දී තිබුණද මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවීම හේතුවෙන් රජයේ අරමුදල් අපේක්ෂිත පරමාර්ථ ඉටු කර ගැනීම වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදී නිම කළ යුතු ප්‍රජා සංවර්ධන කටයුතු පිළිබඳව දැනුවත් කිරීමක් ලැබී නොමැති බැවින් එලෙස මුදල් ඉතිරිවී ඇත. | ලැබෙන ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වන සේ කටයුතු කල යුතුය. |

3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ "2021 වර්ෂයේ නිවාස යෝජනා ව්‍යාපෘතිය" සම්බන්ධයෙන් කුච්චවේලි, කින්නියා, මොරවැව, කන්තලේ, ගෝමරන්කඩවල සහ සේරුවිල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 හි නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 2.3 වගන්තිය අනුව නැවත පදිංචි කිරීමේ කාර්යය වෙනුවෙන් ග්‍රාම නිලධාරි වසම් 29 ක් හඳුනාගෙන තිබුණද, 2021 වර්ෂය සඳහා උතුරු හා නැගෙනහිර පළාතේ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී "ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නැවත පදිංචි කිරීමේ සැලැස්මේ" ඇතුලත් නොවූ ග්‍රාම නිලධාරී වසම් 97 ක් සඳහා රුපියල් 600,000 ක නිවාස 142 ක් හා රුපියල් මිලියන 1 ක නිවාස 142 ක් සඳහා එකතුව රුපියල් මිලියන 227.20 ක් ලබා දී තිබුණි . | නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 2.3 වගන්තිය අනුව නැවත පදිංචි කිරීමේ කාර්යය වෙනුවෙන් ග්‍රාම නිලධාරි වසම් 29 හඳුනාගෙන තිබුණද, අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි උක්ත සැලැස්මට අමතරව යුද්ධය නිසා විනාශ වූ ග්‍රාම නිලධාරී වසම් 97 ක් ද ඇතුලත් කර නිවාස ඉදිකිරීම් සිදු කර ඇත. | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 2.3 වගන්තිය අනුව කටයුතු කල යුතුය. |

3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය" මඟින් කුකුළු පැටවුන් බෙදාදීමට කටයුතු කර තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විට එකතු වටිනාකම රුපියල් මිලියන 2.25 ක් වූ කුකුළු පැටවුන් 2625 ක් බෙදා දීමට කටයුතු නොකර ඊට අදාළ චෙක්පත අත රඳවාගෙන තිබූ බැවින් එම ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි. | අදාල සැපයුම්කරු රාජ්‍ය ආයතන රැසකට සැපයුම්කරු ලෙස ක්‍රියා කිරීම නිසා නිසි වේලාවට සැපයීම සිදු කිරීමට අපහසු වී ඇත. | ව්‍යාපෘති නිසි පරිදි සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන - 2021" ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් යටතේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිලාභීන් 242 දෙනෙකුට රුපියල් මිලියන 16.34 ක් වටිනා පශු සම්පත් 13714 ක් ලබා දී තිබුණද ප්‍රතිලාභීන් 164 ක් සඳහා ලබා දුන් රුපියල් මිලියන 2.84 ක් වටිනා පශු සම්පත් 3299 ක් අහිමි වී තිබීමෙන් මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ප්‍රශස්ත ලෙස ඉටු වී නොතිබුණි. | මෙම සතුන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් පිටත සිට ප්‍රවාහනය කර තිබීමත්, 2021 වර්ෂයේ වර්ෂා කාලයේ ප්‍රවාහනය මෙන්ම බෙදාහැරීම සිදු කිරීමත් නිසා බෝවන රෝග අසාදනය වී වැඩි සතුන් ප්‍රමාණයක් මිය ගොස් ඇත. | ව්‍යාපෘති වල ප්‍රතිපාදන ප්‍රශස්තවම භාවිතා කළ යුතුය. |

3.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ "ක්‍රීඩා පිට්ටනි සංවර්ධන වැඩසටහන - 2021" මඟින් කන්තලේ, නගර හා කඩවත් හා කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ජාතික පාසල් 3 ක් වෙනුවෙන් රුපියල් මිලියන 9.83 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වැඩ අවසන් කර නොතිබුණි. එමෙන්ම කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ක්‍රියාත්මක කල පිරිවැය රුපියල් මිලියන 2.46 ක් වූ පිට්ටනිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දමාද තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කොන්ත්‍රාත් පරිපාලන කටයුතුවල අකාර්යක්ෂමතාවය මෙම තත්ත්වයට හේතු වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අගුළු දැමීම, අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හා ගෙවීම් ක්‍රමවේදයට කොන්ත්‍රාත්කරුවන් එකඟ නොවීම නිසා ව්‍යාපෘතිය අත්හැර ඇත. | ව්‍යාපෘති නිසි පරිදි සැළසුම් කර කාල රාමුවකට යටත්ව කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටු කල යුතු ව්‍යාපෘති 222 ක් නිම නොකර අත්හැර දමා තිබූ අතර රුපියල් මිලියන 338.9 ක් වූ වාර්ෂික ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 18.26 ක් පමණක් වියදම් කර තිබුණි. | මිල උච්චාවචනය හා අක් මුදල් ප්‍රමාද වීම නිසා සැලසුමට අනුව කටයුතු සිදු කිරීමට නොහැකි විය. | -එම- |

## 3.7 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 හා 4.4 අනුව එකම ආකාරයේ ප්‍රසම්පාදනයන් බෙදීමකට ලක් නොකර සිදුකල යුතුයි. එමෙන්ම සාධාරණීකරණයක් කල හැකි අවස්ථාවකදී පමණක් බෙදා වෙන වෙනම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කල හැකි නමුත් ත්‍රිකුණාමලය නගර හා කඩවත්, ගෝමරන්කඩවල හා සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාල රුපියල් මිලියන 13.72 ක් වටිනා එළවළු මිලදී ගැනීමට මිල ගණන් කැඳවීමේදී කොටස් වශයෙන් ඇණවුම් කිරීම් පදනම යටතේ මිල ගණන් කැඳවා තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ උපරිම සීමාව රුපියල් මිලියන 1 ක් වන නමුත් මෙහිදී එම සීමාව ඉක්මවා රුපියල් මිලියන 3.72 කට ප්‍රසම්පාදන සිදුකර තිබුණි. එම හේතුවෙන් තරඟකාරී ප්‍රසම්පාදන වාසි ලබාගැනීමට නොහැකිවී තිබුණි. | සැපයුම්කරුවන්ගේ පැමිණීම ඉතාම සීමිත වීමත්, සිටින සැපයුම්කරුවන්ගේ ධාරිතාව සීමිත වීම නිසාත් එක් ප්‍රදේශයකට පමණක් සැපයීමේ හැකියාව දන්වා සිටීම නිසාත් කොට්ඨාශ මට්ටමින් වෙන වෙනම ප්‍රසම්පාදනයන් සිදු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව ක්‍රියා කල යුතුය. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පිරිවැය රුපියල් මිලියන 3.64 ක් වැය කර ප්‍රතිලාභීන් 52 ක් සඳහා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා | මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 10 තුල බහුතර ජනතාව ගම්මාන අතහැර ගොස් සිට වරින් වර කුඩා කණ්ඩායම් ලෙස නැවත පැමිණීම නිසා එම | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නැවත පදිංචි කිරීමේ ගම්මානවලින් පමණක් අමාත්‍යාංශයේ නිර්ණායක මත පදනම්ව තෝරාගැනීම් සිදු නොකර පිරිවැය රුපියල් මිලියන 1.75 ක් නැවත පදිංචි කිරීමේ ගම්මාන නොවන වෙනත් ගම්මානවලින් ප්‍රතිලාභීන් 25 දෙනෙකු තෝරා ගෙන ගෙවා තිබුණි. | පිරිසට මෙම ප්‍රතිලාභය දී ඇත. | |
| (ආ) | 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/2021 ලිපියේ 2.4 ඡේදය අනුව විවිධාංගීකරණය වූ අයවැය අරමුදල් සැපයීම හා බෙදාහැරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවත්වන ජනතාව, දිළිඳුකම සහ භූමිය මත පදනම්ව සාධාරණ ආකාරයකින් සිදු කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වෙන් කරන ලද එකතුව රුපියල් මිලියන 41.53 ක් වූ අරමුදලින් ඉහත විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 40.61 ක මුදලක් වියදම් කර තිබුණි. | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ **MF/NPD/01/2021** අනුව කටයුතු කර ඇත. විගනණයෙන් පෙන්වා දුන් පරිදි 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/2021 ලිපියේ 2.4 ඡේදය අනුව කටයුතු සිදු කිරීමට පියවර ගනු ඇත. | චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි අනුගමනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ සිටින දරිද්‍රතාවයෙන් පෙලෙන ජනගහනය 31,698 ක් වුවද සමෘද්ධි සහනාධාර වාර්තාව අනුව සමෘද්ධි ලබාගත් සමෘද්ධි ලාභීන් සංඛ්‍යාව 60,402 ක් වීම විගණනයේදී ප්‍රශ්නකාරී වූ අතර එම හේතුවෙන් සමෘද්ධි ප්‍රතිලාභවලට හිමිකම් නොලබන පුද්ගලයින් 28,704 ක් වෙනුවෙන් රුපියල් මිලියන 958.4 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තේරීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය මැදිහත් වුවත් සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් තෝරා ගැනීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා එහි අදාල නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. | වියදම් සිදු කිරීමේදි නිවැරදි වාර්තා හා තොරතුරු මත පමණක් ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය. |

4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරින් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිලිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය. | දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගෙන කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත. | තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනිමට හා ක්‍රියාත්මක කිරිමට කටයුතු කල යුතුය. |

5. මානව සම්පත් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 16 ක්ද තෘතික මට්ටමේ තනතුරු පුරප්පාඩු 26 ක්ද ද්විතික මට්ටමේ තනතුරු පුරප්පාඩු 173 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පුරප්පාඩු 42 ක්ද වශයෙන් මුළු පුරප්පාඩු ප්‍රමාණය 257 ක් විය. මේ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ආයතනයේ "දැක්ම සහ මෙහෙවර" සඳහා ආයතනයේ අනෙකුත් සේවකයන් මෙහෙයවීමේ ගැටළු පැන නැඟී ඇති අතර තීරණ ගැනීමේ මට්ටමේ සේවක පුරප්පාඩු ප්‍රමාණය ඉහළ අගයක් ගැනීම ආයතනවල කාර්යසාධනයට අහිතකරව බලපා තිබුණි. තෘතීයික, ද්විතීයික සහ ප්‍රාථමික සේවක පුරප්පාඩු ප්‍රමාණය 241 ක්ව පැවති අතර, ආයතනයක ක්‍රියාකාරී සේවක පිරිස වනුයේ මෙම සේවකයින් වන බැවින් මෙලෙස පුරප්පාඩු පැවතීම ආයතනයේ ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවයට හා ඵලදායිතාවයට අහිතකර ලෙස බලපා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු පිරවීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දිගින් දිගටම දැනුම් දීම් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට වහා අවධානය යොමුකර ඒවා පිරවීමට කටයුතු කල යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි. | සියළුම නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හා ස්ථාන මාරුකිරීම් සිදු කිරීම සඳහා සැලැස්මක් කළමණාකරණ කමිටුව විසින් මේ වන විට සකස් කරමින් පවතී. | 2001 අගෝස්තු 22 දිනැති අංක 18 / 2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |